මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
**Public Service Commission of Central Provincial Council**

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>காரியாலயம்<br>Office | 081-2213097 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 081-2213096 | සහකාර ලේකම්<br>உதவி செயலாளர்<br>Asst. Secretary | 081-5631321 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 081-2213082 |
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CPC/PSC/8/3/27/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | | | දිනය<br>திகதி<br>Date | 2021.10. 12 |


මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
ආයතන ප්‍රධානීන් වෙත,

## මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සහ සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන් සඳහා වාර්ෂික ස්ථාන මාරු - 2022

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018.09.03 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව 2022 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු පහත පරිදි යෝජිත කාලසටහනට අනුකූලව ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලෙස අනුමැතිය ලබාදී ඇති ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය හා බැඳේ.

| | |
|---|---|
| ස්ථාන මාරු කමිටු පිහිටුවීම | ඔක්තෝබර් 31 ට පෙර |
| ස්ථාන මාරු අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනය | නොවැම්බර් 30 ට පෙර |
| ස්ථාන මාරු තීරණ ගෙන අවසන් කර ආයතනවලට දැනුම් දීම | දෙසැම්බර් 31 ට පෙර |
| අභියාචනා සලකා බැලීම | ජනවාරි 31 ට පෙර |
| ස්ථාන මාරු අභියාචනා පිළිබඳ අවසාන තීරණය දැනුම් දීම | පෙබරවාරි 15 ට පෙර |
| ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිම | මාර්තු 01 දින සිට |

02. 2022 වර්ෂයට අදාළ මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා වූ වාර්ෂික ස්ථාන මාරු 2022 මාර්තු 01 දින සිට බලපැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරිමට මෙම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරිමට හැකි වන පරිදි සියළුම අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වහාම ක්‍රියාත්මක වන සේ අත්හිටුවිය යුතු වේ. 2021.10.15 දින සිට 2022.02.28 දින දක්වා සුහද ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් භාර නොගැනේ.

03. 2022 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධරයන් :

| සේවාව | 2022 වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නිලධරයන් |
|---|---|
| මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවය | මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාව යටතේ ඇති තනතුරු උපලේඛනය යටතට ගැනෙන තනතුරු නාම යටතේ **MN-04** වැටුප් පරිමාණය ලබන එම සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වී ඇති හෝ නොමැති සියළුම නිලධාරීන් සහ එම සේවා ව්‍යවස්ථාව යටතේ පත්වීම් ලද සියළුම සංවර්ධන නිලධාරීන් |
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය | මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ සියළුම නිලධරයන් |

04. වාර්ෂික ස්ථාන මාරු සඳහා සුදුසුකම් ලැබීම සහ අයදුම්කිරීම :

I. වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ **2.2, 2.4** සහ **2.4.1** ඡේදයන් හි විධිවිධාන අනුව **2021.12.31** දිනට එකම සේවා ස්ථානයක වසර **05** කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් සහ **2.2.3** ඡේදයේ සඳහන් පරිදි දිරි දීමනා ගෙවනු ලබන ප්‍රියමනාප සේවා ස්ථානයක වසර **03** ක් සම්පූර්ණ කළ නිලධරයන් අනිවාර්යයෙන්ම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත සම්පූර්ණ කර ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු බව ඔබගේ කාර්යාලයේ සහ ඔබ යටතේ පවතින සියළුම උප කාර්යාලවල සේවය කරන නිලධාරීන් දැනුවත් කළ යුතුවේ. (මහ රෝහල් ඇතුළු සියළුම සෞඛ්‍ය ආයතනවල නිලධරයන්ගේ අදාළ අයදුම්පත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු වේ)

II. මෙම කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි ස්ථාන මාරු පරිපාටිය පළකර ඇති අතර ඒ සමඟ ඇති පහත සඳහන් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත භාගත කර අදාළ නිලධාරීන් වෙතින් සම්පූර්ණ කරවා ගත යුතුය. නියමිත සේවා කාලය සම්පූර්ණ වී ඇති නමුත් අයදුම්පත් ඉදිරිපත් නොකළ නිලධාරීන් සිටින්නේනම් එම නිලධාරීන්ගේ තොරතුරුද අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු වේ.

| සේවාව | අදාළ ආකෘති පත්‍රය |
|---|---|
| මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවය | ම.ප./වා.ස්.මා./ DO-01 ආකෘති පත්‍රය |
| මධ්‍යම පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවය | ම.ප./වා.ස්.මා./MSO-01 ආකෘති පත්‍රය |

05. ඒ අනුව, **2022** වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත ක්‍රමයට **(Online)** සිදුකිරිමට නියමිත බැවින් එම කටයුතු සිදු කිරිමේදි අදාළ විෂය භාර නිලධරයා පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතුවේ.

I. මුලින්ම ඔබගේ ආයතනයේ gmail නිල විද්‍යුත් තැපැල වෙත පිවිසෙන්න.

II. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිමේ කටයුතු සඳහා පමණක් භාවිතවන විද්‍යුත් තැපැල් ලිපිනය trans.psc.cp.gov@gmail.com මගින් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත එවන ලද අදාළ සේවාවට අයත් google spreadsheet වෙත පිවිසෙන්න.

| | |
|---|---|
| 1 | 2022 වාර්ෂික ස්ථාන මාරු (DO) - සංවර්ධන නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (google spreadsheet) |
| 2 | 2022 වාර්ෂික ස්ථාන මාරු (MSO) - කළමනාකරණ සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනය (google spreadsheet) |

III. එහි තොරතුරු ඇතුළත් කිරිමේදි **Unicode (Iskoola potha)** අකුරු වර්ගය භාවිතා කළ යුතුය.

IV. ඉහත සඳහන් සේවාවන්ට අදාළ google spreadsheet හි ඇති වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් **DO** නිලධාරීන්ගේ තොරතුරු/ වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් **MSO** නිලධාරීන්ගේ තොරතුරු හි ඔබගේ ආයතනයට පමණක් අදාළ ස්ථානයක් වෙන් කර ඇති අතර අදාළ විෂය භාර නිලධරයා විසින් අදාළ නිලධාරීන් වෙතින් සම්පූර්ණ කරවාගත් වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්වල **සඳහන්** අදාළ තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න.

V. වසර **05** කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ ඇති නිලධරයන් සහ දිරි දීමනා ගෙවනු ලබන ප්‍රියමනාප සේවා ස්ථානයක වසර **03** ක් සම්පූර්ණ කළ නිලධරයන් අතරින් ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් නොකරන නිලධාරීන් සිටියහොත් එම නිලධාරීන්ගේ තොරතුරුද අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරීන්ගේ තොරතුරුවලට පසුව අදාළ google spreadsheet හි ඇතුළත් කිරිම අනිවාර්ය වේ.

VI. එම නිලධාරීන්ගේ අයදුම්පත් එවීම අවශ්‍ය නොවන අතර එම නිලධාරීන්ගේ විස්තර ඇතුළත් google spreadsheet හි වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් **DO** නිලධරයන් සම්බන්ධ වාර්තාව/ වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් **MSO** නිලධරයන් සම්බන්ධ වාර්තාව පමණක් මුද්‍රණයකර (Print out) ආයතන ප්‍රධානියාගේ අත්සන සහ මුද්‍රාව සහිතව තැපැල් මගින් අප වෙත එවිය යුතුය.

VII. වෙනත් විශේෂ තොරතුරු හෝ උපදෙස් ඔබ ආයතනයේ විද්‍යුත් තැපැල වෙත යොමුකරන බැවින් විද්‍යුත් තැපැල පිළිබඳව විමසිල්ලෙන් සිටිය යුතුවේ.

06. ඒ අනුව ඉහත උපදෙස් අනුගමනය කර 2022 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරීන්/ කළමනාකරණ සේවා නිලධාරීන් පිළිබඳ තොරතුරු ලේඛනයන් (google spreadsheet) හි තොරතුරු ඇතුළත් කර එහි දක්වා ඇති වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් **DO** නිලධරයන්/ **MSO** නිලධරයන් සම්බන්ධ වාර්තාව (අයදුම්පත් එවීම අවශ්‍ය නොවේ) **පමණක්** ඉල්ලුම්පත් බාර ගන්නා අවසන් දිනය වන **2021.11.19** ට පෙර මෙම කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

වී.ඒ.ඩී.ඩබ්. දයානන්ද,
ලේකම්,
මධ්‍යම පළාත් සභාවේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත් -

1. මධ්‍යම පළාත් සංවර්ධන නිලධාරි සේවයේ සහ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් සාමාජිකත්වය දරණ වෘත්තිය සංගම් වෙත - දැ.ගැ.ස
2. අදාළ විෂය භාර නිලධරයන් වෙත - ඉහත උපදෙස් අනුගමනය කිරීම සඳහා මෙම ලිපියේ පිටපතක් ලබාගන්න.